**ශීර්ෂය 248 - සුරාබදු දෙපාර්තමේන්තුව**

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 248 - සුරාබදු දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 01 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) ආදායම් ලැබීම්**

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ප්‍රධාන කාර්යාලයේ සරප් අංශය වෙත ලැබෙන ආදායම් නිවැරදි ආදායම් ශීර්ෂ යටතේ මාසික ගිණුම් සාරාංශ වල ආදායම් කේතයන් අනුව වර්ගීකරණය නොකර ආදායම් කේත 08 කට අදාළව එකතුව රු. 2,023,290,169 ක් ගිණුම්ගත කර තිබුණි. | බැංකු ගිණුම් වලට ලැබෙන සියලුම දෛනික ලැබීම් EXCEL මඟින් සටහන් කරගෙන එක් එක් ආදායම් ශීර්ෂයට මාසිකව ලද මුළු මුදල CIGAS වැඩසටහනට ඇතුලත් මාසික ගිණුම් සාරාංශවල පෙන්වා ඇත. | ලැබෙන ආදායම් නිවැරදි ආදායම් ශීර්ෂ යටතේ දෛනික හා මාසික වර්ගීකරණ සාරාංශ පිළියෙල කිරීම සිදු කල යුතුය. |
| (ii) | 2023 වර්ෂයේ අප්‍රේල්, මැයි හා ජූනි මාස 03 ට අදාළව බැංකු ගිණුමට සෘජුව බැර වී තිබුණු හඳුනා නොගත් තැන්පතු 11 ක එකතුව වූ රු.6,124,850 ක් ලැබුණේ | බැංකුවට මුදල් බැර කරනු ලැබූ පාර්ශව විසින් තම අනන්‍යතාවය හෙළි කරමින් ඉදිරිපත් වීමක් සිදු නොවන්නේ නම් හා එම තැම්පත්කරුවන් හඳුනා | කාලීනව බැංකු ගිණුමට බැර වන හඳුනානොගත් තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාගෙන්ද යන්න නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව හා අදාළ ආදායම් ශීර්ෂයට නිශ්චිතව අදාළ ද යන්න හඳුනාගැනීමකින් තොරව ගිණුම් ගත කර තිබුණි. | ගැනීමට වෙනත් ප්‍රායෝගික විකල්පයක් නොමැති නම් එම තැම්පතු හඳුනා නොගත් තැම්පතු සේ සලකා රජයේ ආදායම් ශීර්ෂයකට බැර කිරීම සිදුවේ. | |
| **(iii)** | 2023 අයවැය යෝජනා අනුව රැස්කරණු ලබන දෛනික ආදායම් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලෙස උපදෙස් ලබාදී තිබුන ද සමාලෝචිත වර්ෂය තුල දේශීය මත්පැන් සඳහා ඩිජිටල් සලකුණු හා මුද්‍රිත ස්ටිකර් සහ ආනයනික මත්පැන් සඳහා වූ රු.1,001,284,916 ක ස්ටිකර් ආදායම ඇතුළුව බැංකු ගිණුමට සමාලෝචිත වර්ෂයේ බැර වී තිබුණු රු.1,864,060,436 ක් මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණි. තවද ITMIS පද්ධතිය යටතේ සියළුම මුදල් 2023 අගෝස්තු මාසයේ 01 දින සිට මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලෙස ලිඛිත උපදෙස් ලැබී තිබිය දී ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශිය කාර්යාලවල දෛනික වියදම් සඳහා සුළු මුදල් අඛණ්ඩ අතුරු අග්‍රිමයක් ලබාදී ඇත. එම වියදම් පියවීම සඳහා පැවති ක්‍රමවේදය ක්ෂණිකව වෙනස් කිරීමෙන් නිලධාරීන් නොසන්සුන්තාවයට පත්වන බැවින් එම ක්‍රමය වෙනස් කිරීම ක්‍රමවත්ව සිදු කල යුතුව තිබුණි.ඒ අනුව 2024 වර්ෂයේ අප්‍රේල් මස සිට නිසි පරිදි භාණ්ඩාගාරය වෙත දෛනික ආදායම් ප්‍රේෂණය කරන ලදී. | 2023 අයවැය යෝජනා සහ භාණ්ඩාගාර උපදෙස් පරිදි රැස්කරනු ලබන දෛනික ආදායම් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කල යුතුය. |
| **(iv)** | අංක 2155/19 දරන 2019 දෙසැම්බර් 27 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය පළ වූ අංක 10/2019 දරන සුරාබදු නිවේදනයේ සඳහන් ස්වභාවය වෙනස් නොකරන ලද පානීය සහ විකිණීම සඳහා අදහස් කරන බෝතල් ගත කරන ලද මත්පැන් අපනයනය සම්බන්ධව ගිණුම් අංශය වෙතින් | | |

| | | |
|---|---|---|
| ඉදිරිපත් කළ බදු අවකරණ සම්බන්ධ තොරතුරු අනුව 2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදන ආයතන 04 කට අදාළව අවස්ථා 32 කදී රු. 7,301,770,528 ක සුරාබදු මුදලක් අවකරණය කිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| • රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති විධිවිධාන පරිදි මත්පැන් නිෂ්පාදකයින් විසින් රජයට ගෙවිය යුතු සම්පූර්ණ බදු මුදල ආදායමක් ලෙස ගිණුම් ගත කර ඔවුන්ට ලබා දෙන බදු සහනය ආදායමින් ආපසු ගෙවීමක් ලෙස ගිණුම්ගත කළ යුතු බවත්, මුදල් රෙගුලාසි 118 අනුව ආදායමින් ආපසු ගෙවීමේ බලය සුරාබදු ජනරාල්ට ලැබෙන පරිදි නීතිමය ප්‍රතිපාදන සලසා ගැනීම සුදුසු බව නිර්දේශ කර තිබුණ ද මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2023 වර්ෂයේ සුරාබදු අවකරණ මුදල වූ රු.7,301,370,528 ක මුදල ඒ සී ඒ - i(iii) ආකෘතියේ පාද සටහනක් මගින් පෙන්වා ඇත. | මත්පැන් අපනයනයට අදාළව බදු අවකරණය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු විසින් ලබා දී ඇති වීධිවිධාන පරිදි හා මුදල් රෙගුලාසි 118 අනුව කටයුතු කල යුතුය. |
| • මත්පැන් නිෂ්පාදන බදුවලින් අදාළ අවකරණයන් අඩු කිරීමෙන් පසු ශුද්ධ සුරාබදු ආදායම ගිණුම්ගත කිරීම හේතුවෙන් සුරාබදු ආදායම වූ 7,301,770,528 ක් අඩුවෙන් නිරූපණය වීය. තවද සුරාබදු දෙපාර්තමේන්තුවට | ඒසීඒ - i(iii) ආකෘතියේ පාද සටහනක් මගින් පෙන්වා ඇත. | එම |

| | | |
|---|---|---|
| අදාලව භාණ්ඩාගාරයේ ගිණුම්වලද මත්පැන් අපනයනය මත සුරාබදු ආදායම අවකරණයන් සම්බන්ධ තොරතුරු වාර්තා කිරීම සහ නිරුපණය වීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය. | | |
| • සමාලෝචිත වර්ෂයේ මත්පැන් අපනයන සඳහා සුරාබදු අවකරණ සම්බන්ධ ලිපිගොනු නියැදියක් පරික්ෂාවේ දී අවසර පත්‍ර 03 ක සඳහන් රට වෙනුවට වෙනත් රටවලට අපනයනය කර තිබූ අවස්ථා, අවසර පත්‍ර 02 ක සඳහන් නියමිත දිනට පසු දිනයක අපනයනය කිරීම හා නියමිත කාලය දක්වා නොතිබූ අවස්ථාවක්, අවසර පත්‍ර 20 ක කාර්යාල පිටපතේ වගකිවයුතු නිලධාරියෙකු විසින් සහතික කර නැති අවස්ථා සහ රේගු දත්ත පද්ධතියෙන් අපනයන ලියකියවිලි නිවැරදිතාවය තහවුරු කර නොතිබූ අවස්ථාවක් නිරීක්ෂණය විය. | අදාල අපනයන බලපත්‍රවලට විදේශික ගැණුම්කරුගේ ඉල්ලීම පරිදි අදාල මත්පැන් තොගය නැව් ගත කරන ලදි. | අපනයන අවකරණ සම්බන්ධයෙන් විධිමත් අභ්‍යාන්තර පාලන ක්‍රමයක් ඇතිකල යුතුය. |
| • අපනයන කිරීමට යෝජිත මත්පැන් තොග කන්ටේනර් ගත කිරීම සනාථ කිරීම සඳහා වූ ලේඛන වල ඒකාබද්ධ පරීක්ෂාවක් සුරාබදු සහ රේගු නිළධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදුකර තිබුණු බව සඳහන් වුවද | වෙනත් ආයතනයක් මඟින් නිකුත් කරන ලද ලේඛනයක අත්සන් තැබීමට ශ්‍රී ලංකා රේගුව බැඳී නොමැති බව ප්‍රකාශ කර ඇත. | අපනයන වලට අදාළව සුරාබදු දෙපාර්තමේන්තුව සහ රේගු දෙපාර්තමේන්තුව ඒකාබද්ධ සුපරීක්ෂණය හා අධීක්ෂණය සිදුවන බවට ලේඛණමය සාක්ෂි වලින් තහවුරු වීමේ ක්‍රමවේදයක් පැවතිය යුතුය. |

එම ලේඛන වල මත්පැන් තොග හරියාකාරව කන්ටේනර් ගත කර ඇති බවට සුරාබදු නිළධාරීන් විසින් පමණක් සහතික කර තිබුණු අතර රේගු නිළධාරීන් විසින් අත්සන් යොදා සහතික කිරීම සිදු නොකරන බව නිරීක්ෂණය විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 අයවැය ඇස්තමේන්තු ප්‍රකාරව සමස්ත සුරාබදු හා දුම්කොළ බදු ආදායම් ඇස්තමේන්තුව රු.217,035,000,000 සිට 182,000,000,000 දක්වා රු.35,035,000,000 හෙවත් සියයට 16 ක ප්‍රතිශතයකින් අඩු කර සංශෝධනය වී තිබුණි. | 2023 වර්ෂයේ මත්පැන් සඳහා රු. බිලියන 181 ක් හා දුම්කොළ බදු සඳහා රු.බිලියන 1 ක් වූ සංශෝධනයද ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කොට ඇත. | මනා අධික්ෂණයක් හා සුපරීක්ෂණයක් ක්‍රියාත්මක කරමින් අපේක්ෂිත ආදායම් ඇස්තමේන්තු ඉලක්ක සපුරාගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | වර්ෂය තුල සමස්ත සංශෝධිත සුරා බදු හා දුම්කොළ බදු ආදායම් ඇස්තමේන්තුව වූ රු.182,000,000,000 සමග සැසදීමේදී රු.171,273,655,832 ක බදු ආදායමක් රැස්කර තිබුණි. එය ප්‍රතිශතයක් වශයෙන් සියයට 94 ක් වුවද සමාලෝචිත වර්ෂයේ මුල් අයවැය ඇස්තමේන්තුව සමග සැසදීමේදී 78 ක ප්‍රතිශතයක් විය. | නිරීක්ෂණය නිවැරදි නමුත් 2023 වර්ෂයේ සුරාබදු ආදායම රු. 171,273,655,832 වන අතර, සුරාබදු මත බදු අවකරණය 2023 වර්ෂයේදී රු.7,301,770,528 කි. ඒ අනුව සමස්ථ සුරාබදු ආදායම රු.178,575,426,360 ක් වේ. ඒ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය 98.1% ක් වේ. | එම |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සුරාබදු දෙපාර්තමේන්තු තොරතුරු අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මත්පැන් වර්ග 10 කින් මත්පැන් වර්ග 7ක මත්පැන් නිෂ්පාදනය සංශුද්ධ මධ්‍යසාර ලීටර් 8,396,933 කින් හෙවත් සියයට 19 ප්‍රතිශතයකින් අඩු වීමක් නිරීක්ෂණය විය. තවද මත්පැන් නිෂ්පාදනය අඩු වී තිබුණ ද සුරා බදු ආදායම ඉහල යාම සඳහා අවස්ථා 02 කදී සුරාබදු නිවේදන 02 ක් මඟින් සුරාබදු අනුපාතය සියයට 20 පරාසයකින් වැඩිවීම බලපා තිබුණි. | මත්පැන් බදු හේතුවෙන් මිල ඉහලයාම හා උද්ධමනය හේතුවෙන් ක්‍රය ශක්තිය අඩුවීම නිසා මත්පැන් සඳහා ඉල්ලුම අඩුවීම හේතු කොට ගෙන නිෂ්පාදනය අඩුවීම ද නිරීක්ෂණය වේ. | මත්පැන් නිෂ්පාදනය අඩුවීම තුලින් ව්‍යාජ මත්පැන් වෙළඳපොළට පැමිණීම වලක්වා ගැනීමට අදාළ වැටලීම් කල යුතුය. |
| (ඈ) | හිඟ සුරාබදු ආදායම් | | |
| | 2023 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කල හිඟ ආදායම් වාර්තාව අනුව මත්පැන් නිෂ්පාදන ආයතන 13 කින් රු. 7,159,178,778 ක්ද රා නිෂ්පාදන ආයතන 13 කින් රු. 6,218,940 ක්ද මත්පැන් ස්කාගාර 03 කින් රු.31,483,610 ක් ද සුරාබදු සහ මත්පැන් නිෂ්පාදන ආයතන 04 කින් අපතය සඳහා හිඟ බදු රු.68,392,684 ක් ද ඇතුළුව මුලු හිඟ සුරාබදු ආදායම සහ එයට අදාල හිග ප්‍රමාද ගාස්තු එකතුව රු.7,265,274,012 ක් විය. හිඟ ආදායම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 128 (1) (උ) ,128 (2) (ඉ) විධිවිධාන සහ එම බලපත්‍ර වලට අදාළව 1912 අංක 8 දරණ සුරාබදු ආඥා පනත සහ ඊට අදාළව | 2024 වර්ෂයේ දී එක් ස්කාගාරයකින් රු. 8,676,985 ක් ද රා සම්බන්ධව පොල් රා නිෂ්පාදනාගාර 03 කින් රු. 4,514,250 ක් හා තල් රා නිෂ්පාදනාගාර 09 ක හිඟ මුදල් අය වි ඇත.තවද වර්තමාන හිඟ බදු වලට අදාළව රු. 706,302,955 ක් 2024 වර්ෂයේ අය වී ඇත. | සුරාබදු ආඥාපනත ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| සංශෝධනයන් හා සුරාබදු නිවේදන වල විධිවිධාන ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. නිරීක්ෂණයන් පහත දැක්වේ. | | |
| (i) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක හිඟ ආදායම් වාර්තා සමග සැසඳීමේදි අයවිය යුතු මුළු හිඟ සුරා බදු ආදායම ක්‍රමයෙන් වැඩි වීමක් නිරික්ෂණය විය. | සුරාබදු මුදල් නියමිත දිනට නොගෙවුවහොත් වාර්ෂිකව 36% ක් බැගින් ප්‍රමාද ගාස්තුවක් එකතු වේ. එසේ වාර්ෂිකව ප්‍රමාද ගාස්තු වැඩිවීම හේතුවෙන් 2019 වර්ෂයේ සිට හිඟ ආදායමේ වැඩිවීමක් පෙන්නුම් කරන බව කාරුණිකව දන්වා සිටිමි. | එම |
| (ii) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වසර 05 කට වැඩි කාලයක සිට ආයතන 04 කින් අයවිය යුතු හිඟ සුරාබදු ආදායම් රු. 409,254,141 ක් සහ ඒ සඳහා වු ප්‍රමාද ගාස්තුව රු. 2,127,769,607 ක එකතුව රු. 2,537,023,748 ක් විය. | මෙම හිඟ බදු මුදලින් රු. 2,537,023,747 ක් වසර 15 ඉකුත් වු හිඟ බදු මුදල් වේ. ඉන් ආයතන 03ක් දැනට ක්‍රියාත්මක නොවේ. ඉන් එක් ආයතනයක අයවිය යුතු හිග බදු මුදල් සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවති. අනෙක් ආයතන දෙකෙන් අයවිය යුතු හිඟ සුරාබදු හා අධිභාර ගාස්තු ගෙවීම සඳහා 2011.11.30 දින නීතිපති දෙපාර්තමේන්තුවේ මඟ පෙන්වීම යටතේ ගිවිසුමක් අත්සන් කර තිබුණි. නමුත් 2014.04.25 දින සිට මෙම සමාගම් ගිවිසුමට අනුව හිඟ සුරාබදු හා අධිභාර ගාස්තු ගෙවීම පැහැර හැර ඇත. එම හේතුවෙන් මෙම සමාගම් දෙකට බලපත්‍ර ලබාදීම අත්හිටුවා ඇත. තවද අනෙක් ආයතනයෙන් අයවිය යුතු හිඟ බදු හා අධිභාර සම්බන්ධයෙන් නඩුවක් අධිකරණයේ ගොනු කර ඇත. | එම |

| | | |
|---|---|---|
| (iii) තවද 2019 වර්ෂයේ සිට තවත් එක් ආයතනයකින් අය විය යුතුව පැවති හිඟ සුරාබදු ආදායම් රු.1,292,877,138 සහ ඒ සඳහා ප්‍රමාද ගාස්තු වූ රු. 1,921,514,810 ක එකතුව රු. 3,214,391,948 ක් විය. | මෙම ආයතනය හිඟ බදු හා අධිභාර සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් ගොණුකර ඇත. | නෛතික විධිවිධාන පරිදි කටයුතු කල යුතුය. |
| (iv) ඉහත 2.1 (ඇ) ii හි සඳහන් ආයතනයක් සහ iii හි සඳහන් ආයතනය සහ ආයතන 06 ක් ඇතුළු මත්පැන් නිෂ්පාදන ආයතන 08 කින් සුරාබදු සහ ප්‍රමාද ගාස්තු එකතුව රු. 1,404,820,502 ක හිඟ ආදායමක් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට විය. | වර්තමාන හිඟ සුරාබදු ආදායම ආයතන 01ක් හිඟ බදු මුදල් හා අධිභාර අයකර ගැනීම සඳහා 2024.02.29 දින හා ආයතන 02ක් 2024.02.28 දින එකඟතා ගිවිසුමකට එළඹී ඇත. මේ වන විට එම බදු මුදලින්, අධිභාර වලින් රු. 306,093,064 අයකර ගෙන ඇත. තවද ආයතන 05ක් විසින් හිගබදු සහ අධිභාර රු. 400,209,891 ක් 2024 වර්ෂයේ දී ගෙවා අවසන් කර ඇත. | එම |

(ඉ) හිඟ දුම්කොළ බදු

| | | |
|---|---|---|
| (i) 2009 අංක 01 දරණ දුම්කොළ සාමාන්‍ය නියෝග අනුව ලියාපදිංචි සහතික ලබා නොගෙන දුම්කොළ ආනයනය කිරීමට කටයුතු කිරීම හේතුවෙන් ආයතන 02 කින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු. 6,688,478 ක හිඟ දුම්කොළ බදු ආදායමක් විය. | එක් ආයතනයකින් 2024 වර්ෂය තුල රු.800,000 ක් ගෙවා ඇති අතර අනෙක් ආයතනයේ අයිතිකරු විදේශගතව ඇති බැවින් මෙම බදු මුදල අයකර ගැනීම සඳහා නීති අංශය වෙත යොමුකර ඇත. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරිම හා ගිවිසුම් කඩ කිරීම සම්බන්ධයෙන් නෛතික විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) දුම්කොළ හා ඒ ආශ්‍රිත කර්මාන්ත නියාමනය, බදු අය කිරීම, අධීක්ෂණය හා පාලනය | බීඩි නිෂ්පාදනය සඳහා කිසිදු බදු මුදලක් අයවී නැතැයි සඳහන් නිෂ්පාදකයින් 387 න් සුරුට්ටු නිෂ්පාදකයින් 44 ක් | දුම්කොළ බදු පනත යටතේ වූ නිවේදනයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා වූ 2004 අංක 09 දරන දුම්කොළ බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1999 අංක 08 දරන දුම්කොළ බදු පනතේ 2 වගන්තිය හා 21 වගන්තිය යටතේ 2022 දෙසැම්බර් 31 දිනැති බීඩි සඳහා දුම්කොළ බද්ද පැනවීමට අදාළ දුම්කොළ බදු පනත යටතේ වූ නිවේදනය සහ 2023 ජනවාරි 18 දිනැති අංක 1/2023 චක්‍රලේඛය මඟින් නෛතික විධිවිධාන සලසා තිබුණි. බීඩි කර්මාන්තයේ නිරත ආයතන 316 කින් ආයතන 212 ලියාපදිංචිය අළුත් කර නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් පසුවිපරමක් සිදුවී නොතිබුණි. ලියාපදිංචි වී තිබු ආයතන 104 න් සමාලෝචිත වර්ෂය තුල කිසිදු බදු මුදලක් අයවී නොතිබුණි. බදු අයකර ගැනීමේ දී සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ වශයෙන් නිෂ්පාදකයින් වර්ග කර නොතිබුණි. | හා දුම්කොළ ආනයන කරුවන් 27 ක් සඳහා බදු අදාළ නොවේ. ලියාපදිංචිය අළුත් කර ඇති 212 කින් බදු ආදායමක් ලැබී නැත. ඉතිරි ආයතන සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවති. | |
| (ඊ) | අපතයන් සඳහා හිඟ සුරාබදු | | |
| | එක් එක් නිෂ්පාදනාගාර සහ ස්කාගාර වලට අදාළව අයවිය යුතු නිෂ්පාදන අපතයන් සම්බන්ධයෙන් මාසිකව හා ත්‍රෛමාසිකව | වාර්තා වී ඇති අපතයන්ට අදාල බදු මුදල් 2023.12.31 දිනට හිඟ බදු වාර්තාවේ ඇතුලත් කර ඇත. | අපතයන් සම්බන්ධ හිග ආදායම් මාසිකව හා ත්‍රෛමාසිකව අඛණ්ඩව ප්‍රාදේශිය කාර්යාල වලින් වාර්තා විය යුතුය. |

| | | |
|---|---|---|
| මූල්‍ය තොරතුරු අඛණ්ඩව ප්‍රාදේශීය කාර්යාල වලින් ආදායම් අංශය සහ ගිණුම් අංශය වෙත වාර්තා නොවීම, දීර්ඝ කාලයක් තිස්සේ හිඟ ආදායම් අය නොවී පැවතීම, ලිපිගොනු වල තොරතුරු වලට අමතරව ඒ සම්බන්ධව එක් එක් ආයතන වලට අදාළව සම්පූර්ණ තොරතුරු ආදායම් ලේඛන සහ හිඟ ආදායම් ලේඛන පවත්වාගෙන නොයාම මු.රෙ. 128 (2) (ඇ) පරිදි හිග ආදායම් වාර්තා වල අයවිය යුතු සියළුම ආයතනවල අපතයන් සම්බන්ධ හිඟ ආදායම් තොරතුරු වාර්තා නොවීම ආදි අඩුපාඩු නිරීක්ෂණය විය. | 2016.12.09 දිනැති අංක 991 සුරාබදු නිවේදනය අනුව අපතය මත බදු අය කිරීම, අදාල ඒකකයේ සුරාබදු ස්ථානාධිපති, සුරාබදු අධිකාරි හා සහකාර සුරාබදු කොමසාරිස්ගේ වගකීම බව | |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූලධන වියදම් | | |
| මූලධන වැය විෂයයන් 07 ක් සඳහා රු. 438,000,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණද ඉන් එකතුව රු.166,569,268 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එම වැය විෂයන්ගේ ඉතිරිය රු.271,430,732ක් විය. | RASED ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සුදුසු සේවාදායකයෙක් තෝරාගැනීමේදී ඇතිවූ ගැටලුකාරී තත්වය මත සැලසුම් කර තිබූ සමහර ප්‍රසම්පාදන කටයුතු අවලංගු කිරීමට සිදුවීමත්, ඇතැම් ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම මත, ප්‍රතිපාදන ඉතිරිවිය. | සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා වූ ආදායම් පරිපාලන පද්ධතිය ස්ථාපිත කිරිම වැනි අත්‍යාවශ්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත සහ අංක 04/1994 හා 1994 පෙබරවාරි 18 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය | | වාර්ෂික වත්කම් හා බැරකම් ප්‍රකාශයන් සුරාබදු දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිළධාරීන්ගෙන් ලබා ගැනීමට කටයුතු කල යුතු වේ. 2023 දෙසැම්බර් 31 දිනට නිළධාරීන් 120 දෙනෙකු චක්‍රලේඛය ප්‍රකාරව අදාළ වාර්තා ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය විය. | 2023.12.31 දිනට නිළධාරීන් 120 දෙනෙකු චක්‍රලේඛ ප්‍රකාරව අදාල වාර්තා ඉදිරිපත් කර නොමැත. | අදාළ නෛතික විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) | 2019 දෙසැම්බර් 27 දිනැති අංක 10/2019 දරන සුරාබදු නිවේදනය | 7,301,770,528 | සුරාබද්දක් ගෙවීම මත හෝ බදු රහිත පදනමක් මත මත්පැන් අපනයනය සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට පිළිගත හැකි ඇපකරයක් හෝ බැංකු ඇපයක් තැබිය යුතු බව සඳහන් විය. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ සැර මත්පැන් නිෂ්පාදන ආයතන 03 ක් විසින් අවස්ථා 06 කදී හා ධාන්‍ය මත්පැන් නිෂ්පාදන ආයතනයක් අවස්ථා 26 ක දී අපනයනය කල මත්පැන් ලීටර් 16,364,975 ක් සඳහා වූ රු.7,301,770,528 ක | ඇප ආවරණ සම්බන්ධයෙන් චක්‍රලේඛයක් නිකුත් කිරීමට කටයුතු කර ඇත. | සුරාබදු නිවේදන විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සුරාබදු අවකරණ සඳහා නිසි පරිදි ඇප ආවරණය වී නොතිබුණි. | |
| (iii) | 2008 අප්‍රේල් 10 දිනැති අංක 1544/17 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය, අංක 902 සුරාබදු නිවේදනය, 2015 දෙසැම්බර් 15 දිනැති අංක 1945/17 දරණ අතිවිශේෂ ගැසට් නිවේදන අංක 983 සුරාබදු නිවේදනය, 2017 දෙසැම්බර් 11 දිනැති අංක 2049/4 දරණ ගැසට් නිවේදන අංක 1004 සුරාබදු නිවේදනය, 2018 ජනවාරි 18 දිනැති අංක 2054/41 දරණ අතිවිශේෂ ගැසට් නිවේදන අංක 3/2018 සුරාබදු නිවේදනය, හා සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ 2022 ඔක්තෝබර් 04 දිනැති අංක ර.සී / එල් බී/04/ආදායම් බලපත්‍ර පොදු (vi) චක්‍රලේඛය | | 2023 වර්ෂය සඳහා අලුත් කරනු ලැබූ බලපත්‍ර සම්බන්ධයෙන් වූ නියැදි විගණන පරීක්ෂාවේදී රටබීම 4 බලපත්‍ර, ර.බී. 7 හා ර.බී. 22 ඒ සහ බී බලපත්‍ර අළුත් කිරීමේ දී පොලිස් වාර්තා ඉදිරිපත් නොවීම, සංචාරක මණ්ඩලයේ අනුමැතිය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන බදු ගෙවූ බවට සාක්ෂි ආදිය ලිපි ගොනුව තුළ නොතිබූ බැවින් බලපත්‍ර ගාස්තු වලට අදාළව එම අවශ්‍යතාවය ඉටුකර නොමැති බව නිරීක්ෂණය විය. | 2023 වර්ෂයේ එම වසර අවසානයේ ඇතිවූ තාක්ෂණික ගැටලුවක් මත බදු නිෂ්කාශණ සහතික හා ඇතිවූ තදබදය මත සංචාරක මණ්ඩල අනුමැතිය ප්‍රමාදවීම මත අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් ගේ 2023.12.13 දිනැති අංක ED/04/Miscellaneous ලිපිය අනුව ආදායම් බදු නිෂ්කාශණ හා සංචාරක මණ්ඩල අනුමැතිය පසුව ලබා ගැනීමට යටත්ව සුරාබදු බලපත්‍ර අලුත් කිරීම සිදුකර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iv) | 2016 දෙසැම්බර් 09 දිනැති අංක 991 දරන සුරාබදු නිවේදනය මගින් සංශෝධිත 2002 අප්‍රේල් 18 දිනැති 844 දරන සුරාබදු නිවේදනය | 68,392,384 | සුරාබදු නිවේදනය පරිදි ලබාදෙන සහනදානය ඉක්මවා යන්නා වූ අවස්ථාවේ බලපවත්වන බදු අනුපාතිකයන්ට අනුව රජයට බදු ගෙවිය යුතු බව සඳහන් වූ අතර සමාලෝචිත වර්ෂයේ මත්පැන් නිෂ්පාදනාගාර 04 කින් රු. 68,392,384 ක අපතයන් සඳහා බදු අයකරගෙන නොතිබුණි. | එක් ආයතනයකින් අයවිය යුතු අපතය සඳහා වූ හිඟ බදු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් කමිටුවක් මඟින් පරීක්ෂණ සිදු කරන අතර තවත් ආයතන 04 කට ලිපි මඟින් දැනුම් දී ඇත. | එම |
| (v) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XXIV පරිච්ඡේදය , 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 අයවැය චක්‍රලේඛ විධිවිධාන හා 2019 ජූනි 27 දිනැති අංක 05/2019 රාජ්‍ය මුදල් චක්‍රලේඛණයේ 03 (ඉ) ඡේදය | 1,214,537 | (i)සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මිය ගිය නිලධාරීන් 10 දෙනෙකුගෙන් අය විය යුතු හිඟ ණය ශේෂය රු.1,214,537 ක් විය. | මේ වන විට නිලධාරීන් 5 දෙනෙකුගෙන් රු 477,610 මරණ පාරිතෝෂිකයෙන් අය කිරීමට කටයුතු කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| | | 1,845,808 | (ii)සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සේවය අතහැර ගිය නිලධාරීන් 14 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු. 1,845,808 ක් විය. | මේ වන විට නිලධාරීන් 13 දෙනෙකුගෙන් රු 1,220,561 ක මුදලක් අය වීමට ඇත. | එම |

| | | | |
|---|---|---|---|
| 1,575,426 | (iii) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වැඩ තහනමට ලක්වූ නිලධාරින් 14 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.1,575,426 කි. | මේ වන විට අය වීමට ඇති මුලු මුදල රු. 1,468,342. කි. | එම |

## 2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 395 (ඇ) ප්‍රකාරව බැංකු ගිණුම් වලට අදාල මාසික බැංකු සැසඳුම් ප්‍රකාශනය ඊළඟ මාසයේ 15 දිනට පෙර පිළියෙළ කර විගණකාධිපති දෙපාර්තමේන්තුවේ පරීක්ෂාව සඳහා සුදානම්ව තිබිය යුතු බව සඳහන් වුවද සුරාබදු දෙපාර්තමේන්තුව විසින් 2021 දෙසැම්බර් 17 දින ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ සුරාබදු කොමසාරිස් ජනරාල් නමින් ආරම්භ කර තිබුණු බැංකු ජංගම ගිණුම සඳහා 2022 වර්ෂයේ සිට මේ දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොමැති බව ද නිරීක්ෂණය විය. බැංකු සැසඳුමක් පිළියෙල නොකිරීම තුල බැංකු සැසඳුමක් මගින් අනාවරණය වන බැංකු ගාස්තු, අගරු චෙක්පත් හා බැංකුව විසින් සිදු කරන වැරදි හඳුනා ගැනීම හා ඒවා නිවැරදිව ගිණුම් ගත වීම | මෙම බැංකු ගිණුම තැම්පත්කරුවන්ගේ නමින් මුදල් සෘජුවම රැස්කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන රැස් කිරීමේ ගිණුමකි. මෙම ගිණුමට දෛනිකව රැස්වන ආදායම් සුරාබදු දෙපාර්තමේන්තුවේ වෙනත් බැංකු ගිණුම් දෙකකට ප්‍රේෂණය කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

සිදුවී තිබේද යන්න පිළිබඳව තහවුරු ලබා ගැනීමට නොහැකි විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිතියෙන් යුත් මත්පැන් වෙළඳ පොළට නිකුත් කිරීමේ සහ නීති විරෝධී මත්පැන් සම්බන්ධ නඩු කටයුතු කඩිනම් කිරීමේ හැකියාව ලැබෙන පරිදි මත්පැන් සඳහා රසායනාගාර පරීක්ෂණ හා මත්පැන්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා රසායනාගාරයක් 2021 වසරේ ස්ථාපනය කිරීම සැලසුම් කර සමාලෝචිත වර්ෂයේ අයවැය මඟින් රසායනාගාරය සඳහා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට රුපියල් මිලියන 100 ක් වෙන් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දරන ලද වියදම රු.1,480,133 ක් හෙවත් සියයට 1.4 ක ඉතා අඩු ප්‍රතිශතයක විමෙන් රසායනාගාරය ස්ථාපිත කිරීමට අදාළව සමාලෝචිත වර්ෂයේ ප්‍රමාණවත් ප්‍රගතියක් නිරීක්ෂණය නොවුණි. | රසායනාගාර උපකරණ සහ ලී බඩු මිලදී ගැනීම 2024 මැයි මස වන විට ටෙන්ඩර් පිරිනැමීමට කටයුතු සිදුකර ඇත. | මත්පැන්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා රසායනාගාරයක් ස්ථාපනය කිරිමට කටයුතු කල යුතුය. |
| (ආ) | මත්පැන් සඳහා නිසි ප්‍රමිති හඳුන්වා දීම යටතේ මත්පැන් වර්ග 11 ක් සඳහා නිර්ණායක 16 ක් යටතේ ප්‍රමිතීන් සකස් කර තිබුණ ද 2023 දෙසැම්බර් 31 දක්වා ප්‍රමිතීන්ට අනුව නිෂ්පාදනය සඳහා විධිවිධාන බලාත්මක කළ හැකි අයුරින් ප්‍රමිතින් සම්බන්ධ ගැසට් නිවේදන නිකුත් වී නොතිබුණි. තවද මහ රා සඳහා ප්‍රමිත ස්ථාපිත කිරීමට අදාළ කටයුතු මේ දක්වාම නිම වී නොතිබුණි. | ප්‍රමිතීන් සඳහා සකස් කරන ලද කෙටුම්පත අනුමැතිය සඳහා 2024.03.27 දින රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යවන ලදි. | ප්‍රමිතීන්ට අනුව විධිවිධාන බලාත්මක කළ හැකි අයුරින් ගැසට් නිවේදනය නිකුත් කිරීම කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | කාර්යක්ෂම ආදායම් පරිපාලනය, සේවාදායකයන් සඳහා ඉහළපෙලේ සේවාවක් ලබාදීම, රාජ්‍ය ආයතන හා දත්ත හුවමාරු විධිමත් කිරීම හා මානව සම්පත් කළමනාකරණය සඳහා විධිමත් සැපයුම්දාමයක් ක්‍රියාත්මක කිරීම ආදී අරමුණු ඉටුකිරීම සඳහා **RASED** නමින් නව ප්‍රතිසංස්කරණයෙන් යුතු පරිගණක තොරතුරු පද්ධතියක් ක්‍රියාවට නැංවීමේ කටයුතු 2020 දෙසැම්බර් මස ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ මෘදුකාංග සංවර්ධනය සඳහා 2022 සහ 2023 වර්ෂ වල පිළිවෙලින් රු. මිලියන 100 ක් සහ රු. මිලියන 94 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද කිසිදු වියදමක් දරා නොතිබුණි.<br>සුරාබදු දෙපාර්තමේන්තුවේ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය, නිෂ්පාදනාගාර අධීක්ෂණය බෙදාහැරීම් සහ සැපයුම්දාම නියාමනය අපරාධ දත්ත සහ නීති කළමණාකරනය, සුරා බදු සහ බදු පරිපාලනය ආදී වැදගත් ක්ෂේත්‍ර සඳහා යෝජිත මෙම පරිගණක දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම ප්‍රමාදවෙමින් පැවතිම මත ශ්‍රී ලංකා රේගුව , දේශිය ආදායම් දෙපාර්තමේන්තුව හා මුදල් අමාත්‍යාංශ තොරතුරු පද්ධතිය හා සම්බන්ධ වී ඒකාබද්ධ තොරතුරු පද්ධතියක් ලෙස ක්‍රියාත්මක වෙමින් තොරතුරු හුවමාරු කර ගැනීමේ කටයුතු තවදුරටත් ප්‍රමාද වෙමින් පවතින බව නිරීක්ෂණය විය. | මුදල් අමාත්‍යාංශයේ උපදෙස් පරිදි පද්ධතිය සංවර්ධනය කිරීම උදෙසා විවෘත ප්‍රසම්පාදන ක්‍රමය යටතේ ප්‍රසම්පාදන විශේෂඥයෙකු තෝරා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී. | යෝජිත ආදායම් පරිපාලන පද්ධතිය කඩිනමින් ස්ථාපිත කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | **ස්ටිකර් කළමණාකරණ ව්‍යාපෘතිය**<br>සුරාබදු නිවේදන 7/2021 අනුව පාරිභෝගිකයා වෙත ළඟා වීමට පෙර, සෑම බෝතලයකම හෝ කෑන් එකක් මතම අනුමත ඩිජිටල් සලකුණු මුද්‍රණය වීම යන විධානය අඛණ්ඩව ක්‍රියාත්මක වී නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. | | |
| | (i) සැර මත්පැන් නිපදවන ප්‍රධාන සමාගමක නිෂ්පාදනාගාරයක සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පරීක්ෂණ සටහන් වාර්තා අනුව, | ඩිජිටල් සලකුණු මුද්‍රණය වීම ස්වයංක්‍රීයව සිදුවන බැවින් ඩිජිටල් | සුරාබදු නිවේදනය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | යන්ත්‍රය ස්ථාපනය කරන ලද 2022 ජනවාරි 13 දින සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ මුද්‍රණ යන්ත්‍රය අක්‍රියව පැවතීම මත මිලි.ලී. 180 මත්පැන් බෝතල් 3,601,735 ක් සහ 2023 ජනවාරි සිට පෙබරවාරි 14 දක්වා කාලය තුළ මිලි.ලී. 180 මත්පැන් බෝතල් 66,335ක් ඩිජිටල් සලකුණු මුද්‍රණය නොවීම් වාර්තා වී තිබුණි. | සළකුණු මුද්‍රණය නොවීම පිළිබඳ පරීක්ෂා කිරීමට වෙනම පුද්ගලයින් යොදා ගනිමින් එම මුද්‍රණය නොවූ බෝතල් වෙනම හඳුනා ගනිමින් නැවත එම බෝතල් මත ඩිජිටල් සළකුණු යෙදීමේ ක්‍රමවේදයක් මේ වන විට ක්‍රියාත්මක කොට ඇත. | |
| (ii) | ධාන්‍ය මත්පැන් නිපදවන ප්‍රධාන සමාගමක 2023 ජනවාරි 12 සිට 2023 සැප්තැම්බර් 19 දක්වා දක්වා කාලය තුළ එනම්, අවස්ථා 54 ක දී මුද්‍රණ යන්ත්‍රය අක්‍රියව පැවතීම හේතුවෙන් ඩිජිටල් සලකුණු මුද්‍රණය නොවූ බියර් බොතල් 1,335,591 ක ප්‍රමාණයක් හා බියර් කෑන් 3,362,568 ක ප්‍රමාණයක් හඳුනාගෙන තිබුණි. එම බෝතල් හා කෑන් හඳුනාගත් ප්‍රදේශ වෙත නිකුත් කිරීම සහ අපනයනය කිරීම සඳහා සුරා බදු දෙපාර්තමේන්තුව විසින් ලිඛිත අනුමැතිය ලබාදී තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. | වෙනම පුද්ගලයන් යොදා ගනිමින් ඩිජිටල් සළකුණු මුද්‍රණය නොවූ බෝතල්/කෑන් හඳුනා ගනිමින් නැවත එම බෝතල් මත ඩිජිටල් සළකුණු යෙදීම සිදු කරනු ලැබේ.<br>තවද එම ඩිජිටල් සළකුණු පියවී ඇසට පෙනෙන ආකාරයටම මුද්‍රණය කිරිම සඳහා කොන්ත්‍රාත් ආයතනය එකඟ වී ඇත. සුරාබදු නිලධාරීන් හට ඩිජිටල් සළකුණු පරීක්ෂා කිරීමට UV lights ලබා දී ඇත. | එම |
| (iii) | ඩිජිටල් කේතය මුද්‍රණය නොවීම් හඳුනා ගැනීමේ සහ ප්‍රතික්ෂේප කිරීමේ පද්ධතියක් මේ දක්වාත් ස්ථාපිත කර නොතිබුණි. | අර්ධ වශයෙන් මුද්‍රණය වන සහ මුද්‍රණය නොවීම පිළිබඳ වාර්තා මොඩියුලය මඟින් ලබා ගැනිමට නොහැක. නිෂ්පාදනාගාර ලිපිගොනුවල අදාළ | ඩිජිටල් කේතය මුද්‍රණය නොවීම් හඳුනා ගැනීමේ සහ ප්‍රතික්ෂේප කිරීමේ පද්ධතියක් ස්ථාපිත කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | තොරතුරු පවත්වාගෙන යනු ලබයි. | |
| (iv) | ස්ටිකර් කළමණාකරණ පද්ධතියේ මත්පැන්, ව්‍යාජ මත්පැන් හෝ නිර්ව්‍යාජ මත්පැන් බෝතලයක් ලෙස සාමාන්‍ය ජනතාවට හඳුනා ගැනීම සඳහා APP එකක් හඳුන්වා දී තිබුණද එහි ගැටළු පැන නැගී තිබීම, ආරක්ෂිත සළකුණු කළමණාකරණ පද්ධතිය (SFMS) හි වාර්තාකරණ මොඩියුලය (MIS) සංවර්ධනය කිරීම සිදු කර නොමැති වීම නිසා අවශ්‍ය විටෙක දී මෙහෙයුම් සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තරයක් ලබා ගැනීමට නොහැකි වීම. කොන්ත්‍රාත් සමාගම, සුරාබදු දෙපාර්තුමේන්තුවේ හෝ නිෂ්පාදකයන්ගේ භෞතික තොග සත්‍යාපනය සමඟ සංසන්දනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් මෘදුකාංගය මඟින් සලසා නොතිබීම, මාසිකව අර්ධ වශයෙන් මුද්‍රණය සහ මුද්‍රණය නොවීම පිළිබඳ වාර්තාවක් මොඩියුලය මඟින් ලබා ගැනීමට පහසුකම් සලසා නොතිබීම, අවශ්‍ය බිඳ වැටීම් සහිතව දිනකට මුද්‍රණය කරන ලද ඩිජිටල් සලකුණු ප්‍රමාණය සත්‍යාපනය කර ගැනීම සඳහා MIS මොඩියුලය මඟින් නිරන්තරයෙන් කාර්මික ගැටළු පැන නැගී තිබිම ආදි අඩුපාඩු නිවැරදි විය යුතුව පැවතුණි. | ආරක්ෂිත සළකුණු ක්‍රමවේදයේ අඩුපාඩු නොසලකා ගිවිසුම අත්සන් කර තිබුණි. 2022 වර්ෂයේ ගෙවීමට නියමිතව තිබූ මුදල් ඩිජිටල් සළකුණු ක්‍රමවේදයේ තිබූ දෝෂ නිසා එම වර්ෂයේ ගෙවීම් ඇනහිට තිබූ අතර 2023 වර්ෂය සඳහා වෙන් කල ප්‍රතිපාදන මගින් ගෙවීම් සිදු කිරීම හේතුවෙන් එම වර්ෂය සඳහා අමතර ප්‍රතිපාදන ලබා ගැනීමට සිදු විය. | ස්ටිකර් කළමණාකරණ ව්‍යාපෘතිය සමාලෝචනය කර පවතින ගැටළු නිවැරදි කල යුතුය. |
| (v) | විනිමය අනුපාතයේ ඉහල යාම, බැංකු කොමිස්, හා සේවා ගාස්තු ගෙවීම් හේතුවෙන් මුද්‍රිත ස්ටිකර් සහ ඩිජිටල් සළකුණු සඳහා පිරිවැය ඉහල යාමක් නිරීක්ෂණය විය. දේශීය මුද්‍රිත ස්ටිකර් හා ඩිජිටල් ස්ටිකර් සඳහා මත්පැන් නිෂ්පාදන සමාගම් වලින් ස්ටිකරයක් සඳහා අයකරනු ලබන රු. 2 ක් බැවින් ඉහත පිරිවැය වැඩිවීම මත මූල්‍ය අලාභය ආවරණය කර ගැනීම සඳහා අවධානය යොමු වී නොතිබුණි. | ඩොලරයේ අගය ශීඝ්‍ර ලෙස ඉහල යාම නිසා ආයතනයට ගෙවීමට සිදුවන මුදල රු.2/- ට වඩා වැඩිවීම හේතුවෙන් ස්ටිකරයේ මිල සංශෝධනය කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට දන්වා ඇත. | ස්ටිකර් කළමණාකරණ ව්‍යාපෘතිය සමාලෝචනය කර රජයට වැය බරක් නොවන ලෙස ක්‍රියාත්මක කල යුතුය. |

| | | |
|---|---|---|
| (vi) අලෙවිය සඳහා බෙදා හරින බෝතල් වල ව්‍යාජ ස්ටිකර් අලවා තිබුණු බලපත්‍ර ලත් ස්ථාන 78 සම්බන්ධයෙන් සුරාබදු නිවේදන අංක 7/2021 හි 25 වගන්තිය සහ සුරාබදු ආඥා පනතේ 27 ,47 හා 56 වගන්ති වල විධිවිධාන පරිදි නිෂ්පාදනාගාර 03 ක් සහ බලපත්‍ර ලත් ස්ථාන 78 ක් වෙනුවෙන්, එම නිෂ්පාදනාගාර 03 විසින් වගකීම භාරගෙන 2023 සැප්තැම්බර් මාසයේදී සමථකරණය වී ඇත. උපරිම සමථ ගාස්තු ලෙස රු. 500,000 බැගින් රු. මිලියන 40.5 ක් සහ සුරා බදු මුදල් හා සියයට 3 ක ප්‍රමාද ගාස්තු වශයෙන් රු. මිලියන 17.938 ක් විමර්ෂණයට භාජනය කර තිබූ නිෂ්පාදන ආයතන 3 න් අය කර ගෙන ඇති බවත් 180 ml මත්පැන් බෝතල් 55,940 ක් රාජසන්තක කර ඉදිරි ක්‍රියා මාර්ග ගනිමින් පවතින බව වාර්තා කර තිබුණ ද අදාළ පරීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොවිනි. | තව දුරටත් විමර්ශන කටයුතු සිදු වෙමින් පවතී. | සුරාබදු ආඥා පනත අනුව කටයුතු කල යුතුය. |
| (vii) මුදල් අමාත්‍යාංශ සහ සුරාබදු දෙපාර්තමේන්තු ඒකාබද්ධ කමිටුව විසින් 2023 ඔක්තෝබර් 16 දින ඉදිරිපත් කල කමිටු වාර්තාව අනුව ඩිජිටල් කේතය අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම. නිෂ්පාදන ක්‍රියාවලියේ වේගයට ඩිජිටල් කේත යොදන යන්ත්‍ර වල වේගය අනුගත නොවීම නිසා ඩිජිටල් කේත අඩංගු නොවන නිෂ්පාදන වෙළඳ පොලට නිකුත්වීම,සියළුම වාර්තා ලබාගැනීමේ මොඩියුල සංවර්ධනය වී නොමැති වීම, ඩිජිටල් මුද්‍රණය වන සහ මුද්‍රණයේ දී අඩුපාඩු සිදුවන ඩිජිටල් මුද්‍රණයන් හඳුනාගැනීමේ ක්‍රමවේදයක් පද්ධතිය තුල නොතිබීම,පියවි ඇසට පෙනෙන ලෙස ඩිජිටල් කේතය මුද්‍රණය කල යුතුවීම,පද්ධතිය නිරන්තරයෙන් අධීක්ෂණය සඳහා සම්පූර්ණ පරිගණක පද්ධතිය තවදුරටත් සංවර්ධනය | නිෂ්පාදන ක්‍රියාවලිය හා සම්බන්ධ සියළුම ස්ථානයන් මේ වන විට සුරාබදු නිලධාරීන් විසින් පරීක්ෂාවට ලක් කරනු ලබයි. වෙනත් පාර්ශවයක සෘජු පරීක්ෂාවකට ලක් කිරීම හා ක්ෂණික විගණනයන් පාරදෘශ්‍යභාවය හා විනිවිදභාවය ඇතිවන ආකාරයට ක්‍රමවේද හඳුන්වාදීම කෙරෙහි අවධානය යොමු කරමින් පවතී.<br><br>සුරාබදු ආඥා පනතේ 33, 34, 35 සහ 48 වගන්තිවල ප්‍රතිපාදන | මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරන ලද කමිටු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම. |

| | |
|---|---|
| කලයුතු බව හඳුනාගෙන තිබුණි.<br>එම කමිටුව විසින් සිදුකර තිබුණු නිර්දේශ වලින් පහත සඳහන් නිර්දේශ වල සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා නොවුණි.<br>• ඩිජිටල් කේතය සහ මුද්‍රිත ස්ටිකර් සඳහා මිල පරාසය නැවත විශ්ලේෂණය කිරීම සුදුසු බව<br>• සුරාබදු ආඥා පනතේ 56 වගන්තිය ඉවත් කිරීම හෝ සමථකරණ ගාස්තු ඉහල නැංවිය යුතු බව<br>• 7/2021 සුරාබදු නිවේදනයේ 15 වගන්තිය ප්‍රකාරව ආරක්ෂිත සලකුණු වල ආකෘතිය, ස්භාවය, විවෘත, ආවෘත හා ව්‍යෝහාරික සළකුණු ආකෘති වෙනස්කල යුතු වීම හා ඒ පිළිබඳ මහජනයා සහ සුරාසැල් හිමියන් දැනුවත් කිරීමට ක්‍රමවේද සැලසීම.<br>• ආරක්ෂිත ස්ටිකරයක් සඳහා නිෂ්පාදකයාගෙන් අයකල යුතු රු.2 ක මිල වර්තමානයට ගැලපෙන ලෙස සංශෝධනය කිරීම.<br>• විධිමත් අධ්‍යානයකින් හා පිරිවැය විශ්ලේෂණයකින් ඩිජිටල් කේත ක්‍රමය සියළුම දේශිය මත්පැන් නිෂ්පාදනයන් සඳහා යොදා ගැනිම උචිත බව | මේ වන විටත් ක්‍රියාත්මක කරමින් සුරා වෙළඳසැල් සහ නිෂ්පාදනාගාර නිරන්තරයෙන් වැටලීම් සිදු කරන අතර තව දුරටත් ව්‍යාජ ස්ටිකර් පරීක්ෂාවන් සඳහාම සුරාබදු චක්‍රලේඛයක් නිකුත් කරමින් මෙම ව්‍යාජ ස්ටිකර් අඩංගු මත්පැන් බෝතල් පරීක්ෂාවන් තර කර ඇත.<br><br>සියළුම දේශීය නිෂ්පාදකයන් සඳහා ඩිජිටල් කේත ක්‍රමය යොදා ගැනීමේදී ප්‍රායෝගික ගැටළු මතුවේ. නමුත් සියළුම දේශීය මත්පැන් නිෂ්පාදකයන් සඳහා මුද්‍රිත ස්ටිකරය (Paper Base) යොදා ගැනීමේ හැකියාවක් පවතින්නේද යන්න පිළිබඳ අධ්‍යයනය කරමින් පවතී. |

## 3.2 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් 2022 දෙසැම්බර් 27 දින අනුමැතිය ලබාදී තිබුණු ඡායාපිටපත් යන්ත්‍ර මිලදී ගැනීමේ දී තෝරාගත් ලංසුකරු ඡායා පිටපත් | ඡායා පිටපත් යන්ත්‍රයට කොල ඇතුලත් කරන ට්‍රේ 02 ක් තිබිය යුතු වුවත්, සැපයුම්කාර සමාගම ට්‍රේ 01 ක් සහිතව යන්ත්‍ර සැපයීම නිසා දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා තිබූ ට්‍රේ 02 අදාල | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| යන්ත්‍ර 11 ක් සැපයීමේදී ට්‍රේ 2 ක් සහිත යන්ත්‍ර සැපයීමට එකග වී තිබුණ ද 2022 දෙසැම්බර් 31 දින ට්‍රේ එකක් සහිත යන්ත්‍ර සපයා තිබීම නිසා ලංසුකරු පිරිවිතර වලට අනුකූල නොවන ලෙස භාණ්ඩ සැපයීමේ දී පිරිවිතර වලට අනුව නිවැරදිව භාණ්ඩ භාරගැනිමකින් තොරව 2022 දෙසැම්බර් 31 දිනට චෙක්පත් ලියා තිබුණි. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) ඡේදය ප්‍රකාරව සැපයුම් කොන්ත්‍රාත් ගිවිසුමකට එළැඹීම සහ ඡායා පිටපත් යන්ත්‍ර භාර ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.3 ඡේදය ප්‍රකාරව කටයුතු සිදුවී නොතිබුණි. | යන්ත්‍ර වෙත සපයන ලෙස සැපයුම්කාර සමාගමට දන්වා ඔවුන් එම සැපයීම සිදුකර නිවැරදි බවට තහවුරු කල පසුව සියලුම ගෙවීම් සිදුකර ඇත.<br>ඉදිරියේදී සිදු කරනු ලබන ප්‍රසම්පාදනයන්වලදී පෙන්වාදී ඇති අඩුපාඩුව සිදු නොවන ආකාරයට කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇත. | |

### 3.3 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සුරාබදු දෙපාර්තමේන්තුවේ ආරක්ෂක සේවා සහ ආරක්ෂිත කැමරා පද්ධති ස්ථාපිත කර තිබියදිත් සුරාබදු දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ ස්ථාන ගත කර තිබුණු විදුලි ජනක යන්ත්‍රයේ උපාංග 2023 සැප්තැම්බර් 04 දින අස්ථාන ගත වීම හේතුවෙන් රු. 4,130,300 ක පාඩුවක් මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කර තිබුණි. මේ සම්බන්ධව මුදල් රෙගුලාසි 104(03) ප්‍රකාරව ප්‍රාරම්භක පරීක්ෂණ | ජෙනරේටර් යන්ත්‍රය අස්ථානගත වීම, සොරකම් කිරීම සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂණයක් පැවැත්වේ. තවද, මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව ප්‍රාරම්භ පරීක්ෂණයක් සිදුකර ඇති අතර, අවසාන පරීක්ෂණය සිදුකර ඉදිරියේදී විගණනයට වාර්තා කරන බව කාරුණිකව දන්වමි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මෙම සිදුවීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග වල ප්‍රගතියද විගණනයට වාර්තා නොවුණි. | | |

## 3.4 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්තුවකට 9,250 බැගින් අපරාධ ග්‍රහන ඉලක්ක 37,000 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණු අතර ග්‍රහනයන් 39,436 ක් සිදුකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ අපරාධ ග්‍රහන පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ. | | |
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා අපරාධ ග්‍රහන ඉලක්ක 37,000 ක් සහ කාර්මික අපරාධ ග්‍රහන 4,000 ක් වශයෙන් මුළු ග්‍රහන 41,000 ක් සැලසුම් කර වර්ෂය තුල අපරාධ ග්‍රහන 39,436 ක් හා කාර්මික අපරාධ ග්‍රහන 5,499 ක් වශයෙන් මුළු ග්‍රහන 44,935 ක් 2023 වර්ෂය සඳහා සිදු කර තිබුණි. සුරාබදු දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය රාජකාරියක් වන නීති ක්‍රියාත්මක කිරීමේ කාර්යය දර්ශකයන් ලෙස | සමාලෝචිත කාලසීමාවට අදාලව විගණන නිරීක්ෂණ වල දක්වා ඇති දත්ත සමග එකඟ වන බව. | කාර්මික අපරාධ සහ අපරාධ ග්‍රහන සංඛ්‍යාව හැකිතාක් 50,000 ක සීමාවට ආසන්නව තබා ගැනිමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | යොදා ගන්නා කාර්මික අපරාධ සහ අපරාධ ග්‍රහන සංඛ්‍යාව හැකිතාක් 50 000 ක සීමාවට ආසන්නව තබාගැනිමේ අවශ්‍යතාවය මුදල් අමාත්‍යාංශය විසින් අවධාරණය කර ඇත. | | |
| (ii) | අපරාධ ග්‍රහන ඉලක්ක සපුරාලීම පිළිබඳ ප්‍රගතිය පරික්ෂාවේදී 2023 වර්ෂයට දී තිබුණු ඉලක්කයන් ඉක්මවා ග්‍රහනයන් සිදුකර තිබුණ ද, සුරාබදු ස්ථාන 25 ක නියමිත ඉලක්කයන් සපුරා නොතිබු බව නිරික්ෂණය වු අතර ඉන් සුරාබදු ස්ථාන 02 ක සියයට 75 කට අඩු ප්‍රතිශතයකින් ද සුරාබදු ස්ථාන 06 ක් සියයට 90 කට අඩු ප්‍රතිශතයකින් ද සුරාබදු ස්ථාන 17 ක් සියයට 90 ත් සියයට 100 ත් අතර ප්‍රතිශතයකින් ද ඉලක්කයන් සපුරා නොතිබුණු බව නිරීක්ෂණය විය. | සංශෝධිත ඉලක්කයන් කරා ලඟා නොවූ සුරාබදු ස්ථාන සඳහා වගඋත්තර විමසීමේ හා අවවාද කිරීමේ ලිපි යොමු කර ඇත. | එම |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| සුරාබදු ප්‍රධාන කාර්යාලයේ 1913 කෙටි සංකේත දූරකථනය ඔස්සේ සුරාබදු මෙහෙයුම් මැදිරිය වෙත මහජනතාව වෙතින් පැමිණිලි 899 ක් ලැබී තිබුණු අතර, ඉන් 317 | 2024 මාර්තු 31 දිනට සාර්ථක ග්‍රහනයන් 365 ක් හෙවත් සියයට 41 ක් සිදුකර ඇත. | මෙහෙයුම් මැදිරිය වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධව කඩිනමින් ක්‍රියාකිරීම හා ඒ සම්බන්ධව පසුවිපරම් කලයුතුය. |

විශේෂ මෙහෙයුම් ඒකකය වෙත ද 554 ක් ද ප්‍රාදේශීය කාර්යාල වෙත 28 ක් මත්ද්‍රව්‍ය නාශක ඒකකයට ද යොමු කර තිබුණු අතර ඉන් 2023 දෙසැම්බර් 31 දිනට සිදුකල සාර්ථක ග්‍රහනයන් 356 ක් හෙවත් සියයට 39 ක් විය.

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමට අදාළ පුරප්පාඩු 38 ක් පැවති අතර ජ්‍යෙෂ්ඨ මට්ටමට අදාළව තනතුරු පුරප්පාඩු සඳහා වැඩ බැලීම් හා රාජකාරි ආවරණය කිරීම් යටතේ නිළධාරීන් පත්කර තිබුනි. | ජ්‍යෙෂ්ඨ මට්ටමට අදාලව අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් තනතුරක්, ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුරක්, සුරාබදු කොමසාරිස් තනතුරු 02 ක්, නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරු 08 ක්, සහකාර සුරාබදු කොමසාරිස් තනතුරු 08 ක්, සුරාබදු අධිකාරී තනතුරු 18 ක් පුරප්පාඩුව පැවතිණි. නමුත් ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුර 2022.12.31 දිනට පෙර දාතම්කර පත්වීම 2024.02.01 දින ලබා දී ඇත. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු තනතුරු පිරවීමටත් අනවශ්‍ය තනතුරු යටපත් කිරීමටත් කටයුතු කල යුතුය. |